# 2023/05/11 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

2023/05/11 වන දින පෙ.ව.09.00ට සභා ලේකම්තුමිය විසින් පැමිණ සිටි ප්‍රජා සංවර්ධන නිලධාරී ඒ.එල්.ඒ.ඩී,චන්දිම මහතා, සංවර්ධන නිලධාරී ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය, කළමනාකරණ සේවා නිලධාරී කේ.තරිඳු දර්ශන ප්‍රියංකුමාර මහතා හා විෂය නිලධාරී පිළිගනිමින් කළමනාකරණ කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව සභා ලේකම්තුමිය විසින් 2023/04/27 දිනැති පසුගිය කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ප්‍රජා සංවර්ධන නිලධාරී ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා යෝජනා කළ අතර එම යෝජනාව සංවර්ධන නිලධාරී ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය ස්ථිර කළේය.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

01) ගමන් වියදම්, අතිකාල දීමනා හා ගෙවීම් වවුචර්පත් සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වවුචර්පත්

I. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත්

| අනු අංකය | නම සහ විස්තරය | ගෙවන මුදල(රු:) | කමිටු තීරණය |
|---|---|---|---|
| 01. | ආර්.එම්.ටී.ඩී.නිශ්ශංඛ මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය සම්බන්ධ රාජකාරි කටයුතු වෙනුවෙන් 2023 ජනවාරි, පෙබරවාරි, මාර්තු මස ගමන් වියදම් ගෙවීම. | 3,446.00 | නිර්දේශ කරන ලදී. |
| 02. | සිලෝන් බිස්නස් ඇප්ලියන්ස් ප්‍රයිවට් ලිමිටඩ් - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ෆින්ගර් ප්‍රින්ට් යන්ත්‍රය සඳහා සී.බී.ඒ. ආයතනය සමඟ ගිවිසුම් ගත වීම සඳහා මුදල් ගෙවීම.( ගිවිසුම් කොන්දේසි සලකා බැලිය යුතුයි.) | 11,881.80 | නිර්දේශ කරන ලදී. |
| 03. | ආර්.එම්.මදූසිකා රත්නායක මිය, සංවර්ධන නිලධාරී - පුහුණු වැඩසටහන් සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට හා පුස්තකාල ශ්‍රවණාගාරයට යාම වෙනුවෙන් 2023 අප්‍රේල් මස ගමන් වියදම් ගෙවීම. | 2,040.00 | නිර්දේශ කරන ලදී. |
| 04. | ටී.එම්.ඩී.එම්.කුමාරිහාමි මිය, සංවර්ධන නිලධාරී- භාණ්ඩ සමීක්ෂණ රාජකාරි කටයුතු වෙනුවෙන් 2023 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම. | 1,079.28 | නිර්දේශ කරන ලදී. |
| 05. | ඩී.එම්.ආර්.යූ.කේ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - අප සභාව සතු රථ වාහන සඳහා අප්‍රේල් මස 16 සිට 30 දක්වා ඉන්ධන සඳහා ගෙවීම. | 68,275.00 | නිර්දේශ කරන ලදී. |
| 06. | ලක්ෂිත මෝටර්ස්, එස්/28, මහියංගණ පාර, බදුල්ල - 252-6368 කැබ් රථය අලුත්වැඩියාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 17,000.00 | නිර්දේශ කරන ලදී. |
| 07. | ඒ.ඒ.ආර්.එම්.ගාමිණී ප්‍රේමසිරි මයා, යුනිවර්සල් ඔටෝ ස්පෙයාස්, නො.235, පහළ වීදිය, බදුල්ල - UPLL-7774 කැබ් රථයේ ඉදිරිපස බ්‍රේක් ඩ්‍රම් එක මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 53,000.00 | නිර්දේශ කරන ලදී. |

II. පොස්ට් මාස්ටර් ජනරාල්ගේ මහජන බැංකුවේ අංක 010100179027344 ගිණුමට බැර යන වවුචර්පත සම්බන්ධව

- ඉහත සඳහන් වවුචර්පත සඳහා දැනට හිඟව පවතින මුද්දර ගාස්තු මුදල ගෙවීමට හා මුද්දර ගාස්තු සඳහා ඉදිරියේදී අත්තිකාරම් වශයෙන් හෝ තැපැල් කාර්යාලයේ රු:5,000/=ක තැන්පතු මුදලක් රඳවා තබා මාස අවසානයේදී මුද්දර සඳහා වැය වූ මුදල පියවීමට හෝ ගෙවීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

02) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 අප්‍රේල් මස ආදායම් වාර්තාව සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

03) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 අප්‍රේල් මස වියදම් වාර්තාව සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

04) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 අප්‍රේල් මස වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

වෙනත් කරුණු යටතේ පහත කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

01) සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය ලබා ගැනීම සඳහා ඉදිරිපත් වූ වවුචර්පත
   - සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය රු:10,000.00ක මුදලක් ලබා ගැනීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

02) රටේ පවතින ඩෙංගු රෝගීන් ඉහළ යාම හේතුවෙන් මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහ මීගහකිවුල නගර ආශ්‍රිතව ඩෙංගු මර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

03) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2024 අයවැයට අදාළ පුවත්පත් දැන්වීම මීගහකිවුලේ පොදු ස්ථාන වල සහ රාජ්‍ය ආයතන වල පල කිරීමෙන් අනතුරුව රාජ්‍ය ආයතන, ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩල හා අනෙකුත් සමිති එක් රැස් කරගෙන අයවැයට ඉදිරිපත් කරන සංවර්ධන යෝජනාව ගැන සාකච්ඡා කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

04) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ගැසට් නිවේදනයේ ගාස්තු සංශෝධනය කිරීම සඳහා අදාළ විෂය නිලධාරී සම්බන්ධ කර ගෙන එම ගාස්තු සංශෝධන කිරීම සඳහා නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

05) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමේදී 2013 පොදු සම්මත අතුරු ව්‍යවස්ථා සියල්ල සභා සම්මත කර ඇති නමුත් ඊට පසු එම අතුරු ව්‍යවස්ථා ප්‍රසිද්ධියට පත් නොකිරීම නිසා 2013 පොදු සම්මත අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නොමැති නිසා එම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කර ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

06) මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් වාහන නවතා තැබීම, වාහන කුලියට දීම හා රථ ගාල් ඇති කිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කිරීම සඳහා නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

07) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ වරිපනම් බදු හා අක්කර බදු අය කිරීම සඳහා ගැසට් කිරීමට අදාල නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

08) මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු ඩොලමයිට් ව්‍යාපෘතියේ ගොඩනැගිල්ල පැවතියත් දැනට එම ඩොලමයිට් ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් වශයෙන් පවතින අතර ඒ නිසා එම ගොඩනැගිල්ල පරීක්ෂා කර බැලීම සඳහා නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, සභා ලේකම්තුමියගේ ස්තූති කතාවෙන් අනතුරුව කළමනාකරණ කමිටුව පෙ.ව.11.00ට අවසන් කරන ලදී.

කමිටු සාමාජිකයින්:-

1) ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙනවිය (සභාපති) -
2) ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා (කමිටු සාමාජික) -
3) ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය (කමිටු සාමාජික) -
4) කේ.නලිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා (කමිටු සාමාජික) -